# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2057/3 - 2018 පෙබරවාරි මස 05 වැනි සඳුදා - 2018.02.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: DEV/LND/02/ACQUI/04-24.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලල්ල උතුර ග්‍රාම නිලධාරි වසමේ, නාඹටුන්න ගමේ පිහිටි මාර/2728 දරන මූලික පිඹුරේ, කැබලි අංක 01 ඉඩම් කොටස (ප්‍රමාණය හෙක්ටයාර් 2.8578 ක් පමණ)

01. කැබලි අංක 01

ඉඩමේ නම: ගොඩැලඩහේන, ගල්කට්ටාවෙහේන *හෙවත්* ගල්කට්ටාව; විස්තරය: අවු. 20-25 ක් පමණ වයසැති කොස්ගස් 7 ක්. අවු. 15-20 ක් පමණ වයසැති තේක්ක ගස්, කුරුඳු ගස් සහිත මිශ්‍ර බෝග වගාවක් ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 2.8578.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 අප්‍රේල් මස 25 වැනි දින පෙරවරු 10.00 ට දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 අප්‍රේල් මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

රංජිත් යාපා,<br>
අත්කර ගැනීමේ නිලධාරි/ප්‍රාදේශීය ලේකම්,<br>
දෙවිනුවර.

2018 ජනවාරි මස 25 වැනි දින,<br>
දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-606

---

**ශුද්ධි පත්‍රිකාව**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: KDS/GIK/4/4/34.<br>
*ඉඩම් අමාත්‍යාංශ ගොණු අංකය*: 4-3/5/2015/CEB/32.

2017 නොවැම්බර් මස 27 වැනි දින අංක 2047/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්*



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් දැන්වීමේ අත්කර ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර තීරය යටතේ ඇති මහ 6726 මූලික පිඹුරේ කැබලි අංක 01 ලෙස දක්වා ඇති ඉඩම් කට්ටියේ හිමිකරුගේ නම පහත පරිදි නිවැරදි විය යුතු ය.

හිමිකම් කියන අය:නදීශානි තක්ෂිලා සමරසිංහ

කේ. ජී. ලැනරෝල්,
ප්‍රාදේශීය ලේකම්,
ගඟ ඉහළ කෝරළේ.

2018 ජනවාරි මස 30 වැනි දින,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-607

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.